[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | චිත්‍ර | පත්‍රය I | පැය - I යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................................................

සැලකිය යුතුයි.

- **සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

පහත දැක්වෙන ඡායාරූපය අසුරු කරගෙන ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.



01). ක්‍රි.ව. 1341-1351 කාලයට අයත් සුවිශේෂී නිර්මාණයක් වන මෙය .......................... ලෙස හඳුන්වයි.

02). මෙම වාස්තු විද්‍යා නිර්මාණය ......................... රජුගේ රාජ්‍ය කාලයේ දී නිර්මාණය කරන ලද්දකි.

03). ධර්ම කීර්ති හිමියන්ගේ අනුශාසනාව පරිදි හා සේනාධිලංකාර ඇමැතිගේ මූලිකත්වයෙන් ඉදිකළ මෙම විහාරය......................... යුගයට අයත් වේ.

04). දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පියකු වන ............................................................... හා ඔහුගේ අනුගාමිකයන් විසින් මෙය ඉදිකර ඇත.

05). මෙම බෞද්ධ විහාරය දකුණු ඉන්දීය ....................................... ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්වයි.

**ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06). පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයේ දී කිරි මැටි හෝ මකුලු මැටි දියකර පෙරා සකස් කර ගන්නා ආලේපය හඳුන්වන නම කුමක් ද? ...................................................................

07). ශ්‍රී ලංකාවේ අනන්‍යතාව හා අභිමානය පිළිබිඹු කරන ජාතික කොඩියේ කඩුව අතින් ගත් සිංහයාගෙන් නිරූපණය වන්නේ කුමක්ද? ..................................................................................

08). කලාත්මක අතින් උසස් කොරවක්ගල් අතර රත්න ප්‍රාසදයේ කොරවක්ගල අයත්වන්නේ කුමන යුගයකට ද ? ....................................................................................................................

09). මැද මහනුවර සම්ප්‍රදායේ සිතුවම් දැකිය හැකි මැදවල විහාරය අයත් විහාරය වර්ග කුමක් ද ?

.............................................................................................................................................

10). මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ පත්තිරිප්පුව නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද ?

.............................................................................................................................................

**ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. හින්දු කෝවිල ආශ්‍රිතව පවත්වන ලද උත්සව වලදී කඹ යොදා ඇදගෙන යන වාහන වර්ගය වන්නේ.

1). කුදිරෙයි වාහනම් 2). මයිල් වාහනම්

3). සිම්ම වාහනම් 4). සප්පරම්

12). ගෝතමී විහාරයේ චිත්‍ර නිර්මාණය කළ ශිල්පියා වන්නේ.

1). ජෝර්ජ් කිට් ශිල්පියා 2). එම්.සාර්ලිස්

3). සෝලියස් මෙන්දිස් 4). බන්දුල හරිස්චන්ද්‍ර

13). පියගැටපෙල නිර්මාණයේ දී එය අලංකාර කිරීම සඳහා භාවිතා නොකළ කැටයම් රූපයකි.

1). වාමන රූප 2). වජ්‍ර සංකේතය

3). පළාපෙති 4). ගවරූප

14). ශ්‍රී ලංකාවේ දනට හමුවී ඇති වාහල්කඩ කැටයම් අතරින් අනුරාධපුර යුගයට අයත් කලාත්මක වාහල්කඩ වන්නේ,

1). රුවන්වැලි සෑයේ වාහල්කඩ 2). රන්කොත් වෙහෙරේ වාහල්කඩ

3). මිහින්තලේ කණ්ඨක චෛත්‍යය වාහල්කඩය 4). අභයගිරියේ වාහල්කඩ

15). වෘෂභ කුඤ්ඤරය නම් සැරසිල්ල සඳහා භවිතා කළ සත්ත්ව රූප වන්නේ,

1). ගවයා සහ ඇතාය 2). සිංහයා සහ ගවයාය

3). ඇතා සහ සිංහයා 4). ගවයා සහ මකරාය

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.**

16). ගණ කැපීම : ..............................................................................................

17). ගෝපුරම් : ..............................................................................................

18). නියපොතු වැඩ : ..............................................................................................

19). නියඳ කෙදි : ..............................................................................................

20). පර්යාවලෝකනයඃ ..............................................................................................

**ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූපයට වඩාත් ගැළපෙන රූපය ඉදිරියේ ඇති A,B,C,D,E අක්ෂරයට අයත් රූප සටහන් ඇසුරින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ දක්වන්න.**


21.  (..........)


 A.

22.  (..........)

C.

 B.

23.  (..........)

 C.

24.  (..........)

 D.

25.  (..........)

 E.

**ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රකාශනයේ නිවැරදි නම් හරි (√) ලකුණ ද, වැරදි (X) ලකුණ ද , ඉදිරියෙන් ඇති හිස්තැනේ යොදන්න.**

26). අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කර දැක්වීම.

කියරොස්කුරෝ සිද්ධාන්තය වේ ( .................................)



27). පද්‍යපංති, විශේෂාංග ලිපි ආදියෙහි අදහස් අර්ථවත් කිරීම සඳහා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරනු ලබයි. ( .................................)

28). මූර්තියක් නෙලීමේ දී අනවශ්‍ය කොටස් කපා ඉවත් කරනු ලබයි ( .................................)

29). චෛත්‍යයක් අව් වැසිවලින් ආරක්ෂාවීමට සාදා ඇති ගෘහය පිළිම ගෙය ලෙස හඳුන්වයි. ( .................................)

30). නිල්, කහ දම් මූලික වර්ණ වේ ( .................................)

**ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරුF,G,H,I,J යන රූප සටහන් ඇසුරින් ලියන්න.**

F. G. H. I. J.

31). F අක්ෂකරයෙන් දැක්වෙන .................................... තුළින් හින්දු කෝවිලක ආරක්ෂාව සංකේතවත් වේ.

32). G අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු .....................................ඇති කොරවක් ගලය.

33). H අක්ෂරයෙන් දැක්වෙනුයේ සිංහල සැරසිලි මෝස්තර වල එන හඳය. මෙය කුමන ගණයට අයත් වේද ? ......................

34). I අක්ෂරයෙන් දැක්වෙන රූප සටහනෙහි උල් වූ තුඩක් සහිත ගෝලාකාර කොටස හඳුන්වන්නේ කුමන නමකින් ද ?..................

35). J රූපයේ දැක්වෙන්නේ දොවොල් මඩු ශාන්තිකර්මයකි. එහි ප්‍රධාන සැරසිලි අංගය නම් කරන්න.

.........................................................................................................

**පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකා වලට අදාළව අර්ථවත් වාක්‍ය 5ක් ලියන්න.**



36). තේමාව - ..............................................................................................

37). ශිල්පියා - ..............................................................................................

38). ආභාෂය - ..............................................................................................

39). වර්ණ භාවිතය - ..............................................................................................

40). කලාත්මක ලක්ෂණ - ..............................................................................................

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - චිත්‍ර | පත්‍රය II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ........................................................................................................................

**කාලය පැය 02**

## II පත්‍රය

නිදහස් රේඛාමය ඇඳීම් හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

01. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා සුදුසු ඔබ සපයාගත් රළු කඩදාසිය භාවිත කරන්න.
02. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා ඔබ යොදා ගන්නා වර්ණ මාධ්‍යයට සුදුසු කඩදාසියක් භාවිත කරන්න.

මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

ඔබේ චිත්‍ර ඇගයීමේ දී පහත සඳහන් නිර්ණායක කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

### රේඛා අධ්‍යයනය

01. රලු කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

### වර්ණ චිත්‍රය

02. ද්‍රව්‍ය සමූහය , තලය මත කලාත්මක සම්පිණ්ඩනය වීම.
03. පරිමාණය, පර්යාලෝක රීති, ඇස් මට්ටම හා ත්‍රිමාන ලක්ෂණ පිළිබඳ අවබෝධය.
03. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වාභාවික හා ගති ලක්ෂණ
05. වර්ණ මාධ්‍ය හැසිරවීමේ දක්වා ඇති ශිල්පීය කුසලතාවය
06. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි.**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

ලකුණු 30

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

## දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 10 ශ්‍රේණිය | විෂයය - චිත්‍ර | පත්‍රය III | පැය - 2 යි. |

නම ................................................................................................................................................

### III කොටස

**කාලය පැය 02**

- අ කොටසින් හෝ ආ කොටසින් ඉ කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

### අ කොටස - සංරචනය

1). ආගමික උත්සවයක සිත්ගත් අවස්ථාවක්

2). මාළු අස්වනු රැගත් ධීවර බෝට්ටු වෙරල ඇවිල්ලා

3). ගම් වැදුණු අලි රංචුවක් අභය භූමියක් තුළ සතුන් නරඹන පිරිසක්

4). විනෝද චාරිකාවක් ගොස් දිය නාන පිරිසක්

### ආ කොටස - මෝස්තර

5). ව්‍යුක්ත සත්ත්ව රූපයක හැඩතල භාවිතා කරමින් සරොම් වාටියකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

06). ස්වභාවික මල්, කොළ හා ගොඩියක් ඇසුරෙන් චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න (ව්‍යාප්ත වීම පිළිබඳ සැළකිලිමත් වන්න)

07). චතුරස්‍රාකාර කුෂන් කවරයක් සැරසිලි කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල ඇසුරින් නිර්මාණය කරන්න.

### ඉ කොටස - ග්‍රැෆික් චිත්‍ර

08). ''දේශීය උරුමයෙන් සුරකිමු'' නැමැති ග්‍රන්ථයට විචිත්‍රවත් පිටකවරයක් නිර්මාණය කරන්න.

09). ''කොවිඩ් වසංගතය දුරු කරමු'' මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

10). මිශ්‍ර පළතුරු බීම බෝතලයක් සඳහා දවටනයක් (ලේබලයක් ) නිර්මාණය කරන්න.

# 10 ශ්‍රේණිය - චිත්‍ර කලාව - I පත්‍රය - පිළිතුරු

01. ගඩලාදෙණිය

02. සතරවන බුවනෙකබාහු රජුගේ

03. ගම්පොළ

04. ගනේෂ්වරාචාර්ය

05. විජය නගර්

06. අල්ලියාදු

07. තේජස හා උත්තරීතරභාවය

08. අනුරාධපුර යුගය

09. ටැම්පිට විහාරය

10. දේවේන්ද්‍ර මූලාචාරීන්

11. 04

12. 01

13. 04

14. 03

15. 01

16. C

17. D

18. E

19. A

20. B

21. √

22. √

23. √

24. $X$

25. $X$

26. යාලි

27. වටදාගෙයි

28. දිව්‍ය ගණය

29. ශබ්රය

30. මඩුව සැරසීම

31. වෙස් මුහුණු නිර්මාණය කිරීමේ දී ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීමයි.

32. හින්දු කෝවිලක ප්‍රධානතම ගෘහ නිර්මාණය අංගය මෙය වේ.

33. ලාක්ෂා මගින් සැරසිලි යෙදීමේ දී නියපොත්ත භාවිතා කරන බැවින් මෙය නියපොතු වැඩ යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලාක්ෂා මගින් සැරසිලි යොදන ප්‍රධාන ශිල්ප ක්‍රමයකි.

34. දුම්බර පැඳුරු කර්මාන්තයේ දී යොදා ගනු ලබන ප්‍රධාන අමුද්‍රව්‍ය වේ.

35. ළඟ තිබෙන වස්තු විශාලවත් දුර තිබෙන වස්තු කුඩාවටත් පෙනීම පර්යාවලෝකනයයි.

36. මෙයින් සිදුහත් කුමරු හා මවු බිසව නිරූපණය කරයි.

37. මෙම නිර්මාණය එම් සාර්ලිස් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

38. අපරදිග/ බටහිර ස්වාභාවිකවාදී චිත්‍ර ශෛලියේ ආභාෂය අනුව රූප රචනය කර ඇත.

පුනරුද යුගයේ අඳින ලද මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන මැඩෝනා චිත්‍ර වල අභාසය ද දැකිය හැක.

39. විචිත්‍ර වර්ණ මාලාවක් භාවිතා කර ඇත.

40. රූපවල ත්‍රිමාණ ලක්ෂණ හොඳින් මතුකර ඇති අතර සමස්ත සිතුවමේ පෙරබිම, සහ පසුබිම පමණක් දක්වා ඇත.
මාළිගා කවුලුවෙන් පෙනෙන පසුබිම පර්යාව ලෝක ලක්ෂණ සහිත භූමි දර්ශනයක් ලෙස දක්වා ඇත.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න